

බටහිර හා නැගෙනහිර කොළඹ ප්‍රදේශයේ ළමා හා යොවුන් නිවාසයන්හි අඩුපාඩු සොයා බැලීමට ප්‍රේමදාස කේන්ද්‍රය හා මිලින්ද මොරගොඩ මහතා ඒකාබද්ධව පියවර ගෙන ඇත.

සමාජයේ අවධානයට ලක්විය යුතු ජනකොටස් කෙරෙහි සැලකිලිමත් වීමේ වැදගත්කමක් මෙම නිවාසයන්හි මූලික පහසුකම් සැලසීමේ හැකියාවන් සොයා බැලීමත් මෙහි අරමුණ වෙයි.

ඒ අනුව ප්‍රේමදාස කේන්ද්‍රයේ සභාපති බී. සිරිසේන කුරේ මහතා සහ පාර්ලිමේන්තු මන්ත්‍රී මිලින්ද මොරගොඩ මහතා නැගෙනහිර හා බටහිර කොළඹ ප්‍රදේශවල පවත්වා ගෙන යන සුබ සාධන නිවාස කීපයක් පසුගියදා නිරීක්ෂණයට ලක් කළේය.

වැල්ලවත්ත ශ්‍රී ලංකාධාර සමිතිය කිරුළපන ලංකා මුවර් කාන්තා සංවිධානය හා ලංකා මුස්ලිම් කාන්තා සමිතිය යන සංවිධාන විසින් පවත්වා ගෙන යනු ලබන අධ්‍යාපන වැඩ සටහන්ද හවුහරණයක් නැති දරු දැරියන්ගේ අනාගතය සකස් කිරීමේ වැඩ පිළිවෙළ කෙරෙහිද ඔවුනගේ අවධානය මෙහිදී ලක්විය.

ඡායාරූපයේ මිලින්ද මොරගොඩ මහතා හා බී. සිරිසේන කුරේ මහතා මුස්ලිම් නියෝජිත පිරිසක් සමඟ කතා කරන ආකාරය දැක්වෙයි.

ක්‍රිස්ටි මහේෂ් ද සිල්වා